# බෞද්ධ කැටයම් කලාවෙන් නිරූපිත සාරධර්ම සන්නිවේදනය

කේ. ඒ. වීරසේන[1]

ශ්‍රී ලංකාවේ පෞරාණික විහාරාරාම මුල්කරගෙන එහි අලංකාරය, සෞභාග්‍යය හා සාරධර්ම සන්නිවේදනය අරමුණු කරගෙන බෞද්ධ කලාකරුවා විසින් සුවිශේෂ කැටයම් කලා නිර්මාණය කොට තිබේ. මෙම කැටයම් කලාව මුරගල, කොරවක් ගල හා සඳකඩපහණ යන කලා අංශවලින් පරිමිත ය.පෞරාණික විහාරාරාමවලකැටයම් ගොඩනැගූයේ සාමාන්‍ය පොළොව මට්ටමට වඩා උස් ස්ථානයක ය. පූජනීය ස්ථානයෙන් සේදී වැටෙන ජල ධාරාව මුළු ප්‍රදේශයට ආශීර්වාදයක් වේ යන්න එදා සමාජය විශ්වාස කළාවන්නට පුළුවන. විහාරාරාම ඉදිකරන විට උස් ස්ථානයක ඉදිකිරීමට වග බලාගන්නට ඇත්තේ ඒ නිසා විය හැකිය. මෙම අරමුණෙහි පිහිටා නිර්මාණය කළවිහාරාරාමවල කැටයම් තුළින් සමාජයට මනා සන්නිවේදනයක් ලබාදී ඇත. ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂාව කෙරේ.

බෞද්ධ වෙහෙර විහාරයන්ට වඳින පුදන නරඹන සැදැහැවතා බුදු දහමේ සංසාරය පිළිබඳව ඉගැන්වෙන යථාර්ථය හා කෙලෙසුන් කෙරෙන් ඈත්වීමෙන් නිර්වාණය ලබාගත හැකිබව සාමාන්‍ය වශයෙන් අවබෝධ කරගෙන සිටියි. එම අවබෝධය සෞන්දර්යාත්මක ව පුද්ගල විඥානය වෙත නැවත නැවතත් සන්නිවේදනය කරන බෞද්ධ කලාකරුවා සඳකඩපහණට යෙදූ කැටයම්වලින් සංසාර චක්‍රය හෙවත් භව චක්‍රය පිළිබඳ අවබෝධයක් ලබාදෙයි. ඒ තුළින් අසාරයෙන් වෙන්ව සාරයෙන් ලෞකික දිවිය සහ ලෝකෝත්තර දිවිය සරුසාර කරගන්නා ලෙස උපදෙස් ලබාදෙයි.බෞද්ධ විහාරාරාමවලට පිවිසෙන පියගැට පෙළ සමග මුළු ගොඩනැගිල්ලේම සෞන්දර්යාත්මක ඒකාබද්ධතාව මුරගල කොරවක්ගල, සඳකඩපහණ හා වාමන රූප ආදි කැටයම් නිර්මාණය කිරීමෙන් රැකදෙන අතර එයින් එම විහාරයට මහේශාක්‍ය බවක් අලංකාරයක් හා වැදගත් අර්ථයක් ද එක් කරයි. බෞද්ධ කලාකරුවා යතිවරුන්ගෙන් අසා දැන උගත් ධර්මය තම කැටයම් කලාව විෂයයෙහි යොදාගනිමින් උසස් ආගමික සංකල්ප ජන විඥානයෙහි රඳවා තබන්නට ගත් උත්සාහය ප්‍රශංසනීය වේ.

විහාර මන්දිරය තුළ වැඩ වසන බුදුරජාණන් වහන්සේගේ ගුණ සමුදාය පිළිබඳ අපරිමිත භක්තියකින්, ශ්‍රද්ධාවකින් මෙනෙහි කරන සැදැහැවතා උන්වහන්සේ වඳින්නට පුදන්නට යන චාරිකාවේදී බෞද්ධ මූලධර්මමය ඉගැන්වීම් ඒ සඳකඩපහණින් නිරූපණය කරන විට තමා කෙරෙහි ඇති අසාරධර්ම වන ලෝභ, ද්වේශ, මෝහ ආදි අකුසල ධර්මයන් යටපත් කර ගන්නටත් සාරධර්මයන් වර්ධනය කර ගන්නටත් අනුබලයක් ලබයි. තෘෂ්ණාව මූලිකව සසර ගමනට පියවර තබනවා වෙනුවට දානය, පරිත්‍යාගය ඉන්ද්‍රිය දමනය ආදි සාරධර්ම වඩමින් සසර ගමන නවතාලන්නට හා නිවන පසක්කර ගන්නට මේ කලාශිල්ප මඟින් ප්‍රබල සන්නිවේදනයක් කරනු ලබයි.

**ප්‍රමුඛ පදඃ සන්නිවේදනය, සාරධර්ම, පෞරාණික, කලාශිල්ප, ඉන්ද්‍රිය දමනය**

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය